# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

( නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

# පුරප්පාඩු

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මගින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කරන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, සැලසුම් ක්‍රියාත්මක කිරීම, ප්‍රමිතිකරණය සහ සහතික කිරීම් යනාදී කාර්යයන් ඉටුකිරීමේ ජාතික නියාමන ආයතනය වේ. මෙම කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තොරතුරු තාක්ෂණ නිලධාරී ( පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 01)**

**සුදුසුකම්**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනතකින් ස්ථාපිත කර ඇති හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට අදාලව වරලත් වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කරන ආයතනකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය තිබීම.

හෝ

තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව , තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ලබාගත් NVQ 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් සමග රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක වසර 08 කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් සුදුසුකම් (තනතුරට /සේවයට අදාල වන පරිදි වෙනත් සුදුසුකම් )**

මව්බස හා ඉංග්‍රීසි භාෂාව හොඳින් භාවිත කළහැකි වීම.

මිට අමතරව පහත සඳහන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව සඳහා සම්මුඛ පරීක්ෂණයේදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

1.පරිගණක ජාල පද්ධති පරිසරයක පරිගණක මෘදුකාංග නිර්මාණය, ක්‍රමලේඛනය හා සංවර්ධනය පිළිබඳ දැනුම

2.PHP,MYSQL සහ CMS භාවිතයෙන් ගතික (Dynamic) වෙබ් අඩවි නිර්මාණය සහ පවත්වාගෙන යෑම පිළිබඳ දැනුම.

3.MS SQL භාවිතය පිළිබඳ දැනුම සහ sql query භාවිතයෙන් විවිධ වර්ගයේ වාර්ථා සැකසීම පිළිබඳ දැනුම.

4.පරිගණක මෘදුකාංග සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම.

5.Windows සහ Linux Servers පිළිබඳ දැනුම.

6.පුද්ගලික පරිගණක ( Personal Computers ) ගැටලු විසඳීම පිළිබඳ දැනුම.

7.පරිගණක ජාල පද්ධති ( Computer Network) පිළිබඳ දැනුම.

**වැටුප්**

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 2/2016 අනුව MA 3 කාණ්ඩයේ වැටුප් පරිමාණය රුः 32200 - 10×445 - 11×660- 10×730-5×750- රු 54960 (මාසික)

**වයස් සීමාව**

අවුරුදු 22ට නොඅඩු හා අවු. - 35ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් කරුණු**

සෑම අපේක්ෂකයෙක්ම,

ආ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

ඇ. තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

ඇ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

**බඳවා ගැනීමේ ක්‍රමය**

තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරඟ විභාගයක හා පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පොදු කරුණු**

අ. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගේ වැටුපෙන් 8% ගෙවිය යුතු අතර, මෙම කොමිෂන් සභාව විසින් ඔබගේ වැටුපෙන් 12% සමාන මුදලක් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

ආ. ඉහත මූලික වැටුපට අමතරව රජයේ අනුමත වෙනත් දීමනා හිමිවේ

ඇ . මෙම තනතුර ස්ථිර වන අතර, පරිවාස කාලයකට යටත් වේ.

ඈ. බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනයේදී ඇති විය හැකි සංශෝධනයන්ට යටත් විය යුතුය

ඉ. අයදුම්පත් යොමු කිරීමේදී ඉදිරිපත් කරනු ලබන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2021 අගෝස්තු 11 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වන අතර සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව**
**''නිපුණතා පියස'' 03 වන මහල**
**354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,**
**කොළඹ 05.**

**TVEC Website : http://www.tvec.gov.lk**

Source: www.tvec.gov.lk (2021.08.05)